# නොබැඳි පිළිවෙතින් බැහැර වුණොත් ලංකාව අමාරුවේ

*මානව සංහතියට එරෙහිව භාවිතාවන බිම් බෝම්බ, සාම්ප්‍රදායික අවි හා සැහැල්ලු අවි, විනාශ කිරීම වෙනුවෙන් 1997 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් නැවත පිහිටවූ අවිහරණය පිළිබඳ දෙපාර්තමේන්තුවේ නියමුවා ලෙස පත්වෙන ආචාර්ය ජයන්ත ධනපාල මහතා, එම අභියෝගාත්මක වගකීම දරමින් මුළු ලෝකයේම අවධානය දිනා ගත්තේය. ජාත්‍යන්තර සංවිධාන රැසක විවිධ වගකිවයුතු තනතුරු හෙබවූ ඔහු වසර හතලිහකට වැඩි කාලයක අත්දැකීම් සහිත කීර්තිධර රාජ්‍ය තාන්ත්‍රික නිළධාරියෙකි. වරක් ඒ මහතා කොළඹ සාම ලේකම් කාර්යාලයේ ප්‍රධානියා ලෙස ද කටයුතු කරමින් කොටි ත්‍රස්තවාදයට සාමකාමී විසඳුම් මාර්ගයක් සෙවීම සඳහා ක්‍රියාකාරීව කටයුතු කළේය. ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය හා එහි වර්තමාන භාවිතාව ගැන ඔහු හා කළ විශේෂ සාකච්ඡාවකි මේ.*

මෙවර බ්‍රිතාන්‍යයේදී මුළු දුන් ලෝක දෙමළ සමුළුවට එරට විදේශ ඇමති ඩේවිඩ් මිලිබෑන්ඩ් මහතා සහභාගීවීම ලංකා ආණ්ඩුවේ විවේචනයට හේතු වී තිබෙනව. රාජ්‍ය තාන්ත්‍රික නිළධාරියකු ලෙස දීර්ගකාලීන අත්දැකීම් සහිත ඔබ මේ සිද්ධිය දිහා බලන්නෙ කොහොමද?

එල්. ටී. ටී. ඊ. සංවිධානයේ බෙදුම්වාදී අරමුණ අනුමත කරමින් කටයුතු කළ ලෝක දෙමළ සංවිධානය ගැනත් එම සමුළුවට සහභාගීවන අය ගැනත් ලංකාව පැත්තෙන් බලන විට අපට විවේචන තියෙන්න පුළුවන්. අපට සතුරුව ඉන්නා කෙනෙකු සමඟ එකට ඉන්න ඕනාම කෙනෙකුව තවත් සතුරෙකු සේ පෙනීයාම ස්වභාවිකයි. එහෙත් එහෙම සංවේදී හැඟීම් උඩ රාජ්‍ය තාන්ත්‍රික ගනුදෙනු කරන්න යාම රටක් විදියට අපට අවාසියි. මොකද අපට යම් විවේචනයක් ඒ සිද්ධිය සම්බන්ධයෙන් තියෙනවා වගේම බ්‍රිතාන්‍ය ආණ්ඩුවටත් එම සමුළුව නියෝජනය කිරීමට අදාළව සාධාරණ හේතු තියෙන්න පුළුවන්. විශේෂයෙන්ම අද ලෝකය පුරා පැතිරිලා ඉන්න දෙමළ ජනතාව, මේ බටහිර රටවල දේශපාලනයට බලපෑම් කළ හැකි මට්ටමක ඉන්නව. ඒ අයට ඒ ඒ රටවල ඡන්ද බලය පවා තියෙනව. ඔවුන්ට තම අරගලය  හෝ ඉල්ලීම් ලෝකෙට ගෙන යන්නට දේශපාලන ශක්තියක් තියෙනව.
දැන් බලන්න දකුණු ඉන්දියාවෙ, තමිල්නාඩුවේ, දෙමළ ජනමතය හැසිරෙන විදිය. මොනව කිව්වත් අවසානයේ එය බෙදුම්වාදී අරමුණත් එක්ක සන්ධානගත වෙනව. එහෙම වුණත් යමක් කරන්න කලින් ඉන්දීය මධ්‍යම ආණුඩුවට ඒ දිහා හැරිල බලන්න සිද්ධ වෙනව. මොකද දකුණු ඉන්දියානු දේශපාලනය මධ්‍යම ආණ්ඩුවේ පැවත්මට බලපානව. එතනදි අපි දැන ගන්න ඕන අපේ පැත්තෙන් කියන්න තියෙන දේවල් ගැන ඉන්දීය මධ්‍යම ආණ්ඩුව සමඟ හරියට කතා කරන්න. එවිට ඉන්දීය ආණ්ඩුවට අපේ පැත්තෙත් බලන්න වෙනව. යුද්ධය යන අතරවාරෙ මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා ඉන්දියාව සම්බන්ධයෙන් ඒ රාජ්‍ය තාන්ත්‍රික ගනුදෙනුව හරියට කළා. රටේ ඒකීය භාවයට එල්ල වූ තර්ජනය ප්‍රබලව ඉස්මතු වූ වෙලාවක කොටි ත්‍රස්තවාදය පැරදවීමට කළ යුද්ධයට බලපෑමක් නොකරන තැනක ඉන්දියාව තබා ගන්නට රාජපක්ෂ ආණ්ඩුව සමත් වුණා. කොටි ත්‍රස්තවාදය පැරදවීමට, ලංකා ආණ්ඩුව මීට පෙර පියවර ගත් තීරණාත්මක අවස්ථාවලදී ඉන්දියාව ඊට කළ බලපෑම් මෙවර වලක්වා ගත් හැටි අපූරුයි. නමුත් ඒ රාජ්‍යතාන්ත්‍රික භාවය බටහිරත් එක්ක පෙන්නුවේ නැහැ.
දකුණු ඉන්දියානු ජනමතය දිහා ඉන්දීය මධ්‍යම ආණ්ඩුවට බලන්නට සිදුවෙන දේශපාලන පරිසරයක, බටහිර රටවල් හා මිතුරුව සිටීම හරිම වැදගත්. දකුණු ඉන්දියාව සමීපයේ කුඩා දූපතක් වන අපේ රටට ඒ බටහිර මිතුරුකම් ඉතා වැදගත්. අනෙක බ්‍රිතාන්‍ය විදේශ ඇමතිවරයා දෙමළ සමුළුවට ගිහින් එල්. ටී. ටී. ඊ. බෙදුම්වාදය අනුමත කළේ නැහැ. ආයුද අතට ගන්නා ත්‍රස්තවාදයත් බෙදුමුවාදයත් ඔහු එහිදී ප්‍රතික්ෂේප කළා. එය වැරදි බව ප්‍රකාශ කළා. මොනම විදියකින්වත් ලංකාවේ අභ්‍යන්තර කටයුතුවලට මැදිහත් නොවන බවත් ඔහු එහිදී කියා සිටියා.

වත්මන් ආණ්ඩුවේ ප්‍රබල පාර්ශව කරුවන් ලෙස පෙනී සිටින සිහල උරුම කණ්ඩායමත් ජනතා විමුක්ති පෙරමුණෙන් කැඩී ආ කණ්ඩායමත් දරන මතය වන්නේ බටහිර යනු රටට සතුරුම පිලක් යන්නයි.